## සුරාබදු ආඥාපනත

### අංක 05/2018 දරන සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 2 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මගින් 2017 නොවැම්බර් මස 09 දිනැති අංක 2044/35 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1001 දරන සුරාබදු නිවේදනයේ උපලේඛනයේ අයිතම 2,3, සහ 4 හිඇතුළත් "පල්පය" යන වචනය අවලංගු කරමින් සංශෝධනය කරනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජනවාරි 22 වැනිදින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.

## සුරාබදු ආඥාපනත

### අංක 06/2018 දරන සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥාපනතේ (52 වන අධිකාරිය වූ) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය, මංගල සමරවීර වන මා විසින් මෙම නිවේදනය මගින් 2017 නොවැම්බර් මස 09 දිනැති අංක 2044/36 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද අංක 1002 දරන සුරාබදු නිවේදනයේ උපලේඛනයේ පළමු වැනි තීරයෙහි දැක්වෙන අයිතම iii, iv, සහ v යනුවෙන් සඳහන් සුරාබද්දට යටත් භාණ්ඩ වල ඇතුළත් "පල්පය" යන වචනය අවලංගු කරමින් සංශෝධනය කරනු ලැබේ.

මංගල සමරවීර,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 ජනවාරි 22 වැනි දින,
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ දී ය.